# අභිමානවත් චාරිකාවක කිතුණු මිනිසා සොයා

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව හා ජාතික කතෝලික ජනසන්නිවේදන කේන්ද්‍රය ඒකාබද්ධව සංවිධානය කරනු ලබන අභිමානවත් සම්මාන පෙළහර මෙම වර්ෂයේ ද 6 වන වරටත් උත්කර්ෂවත් ලෙස සංවිධානය කෙරේ.

මෙම උළෙලේ මුඛ්‍ය අරමුණ, විවිධ නිර්මාණ ක්ෂේත්‍ර තුළ පදවි මට්ටමින් ඇගයීමට පත්විය යුතු කතෝලික කලාකරුවන් තෝරා ජාතික මට්ටමින් ඇගයීමයි.

ජාතික කතෝලික රදගුරු මඩුල්ලේ මඟ පෙන්වීම යටතේ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව හා ජාතික කතෝලික ජනසන්නිවේදන කේන්ද්‍රය ඒකාබද්ධව සංවිධානය කරනු ලබන ධර්මප්‍රභාෂ්වර උත්තමාචාර උළෙල සදහා සම්මානලාභින් තෝරා ගැනීමේ ක්‍රියාවලිය පහත පරිදි වේ.

## සම්මානලාභීන් තේරීමේ ක්‍රියාවලිය

- සම්මානලාභීන් තෝරා ගැනීමට අයදුම්පත් පෞද්ගලිකව කැඳවීම් සිදු කරනු ලබයි.
- අයදුම්කරුවන් රෝමානු කතෝලික ලබ්ධිකයින් වීම අනිවාර්ය වේ.
- මෙම සම්මානය කලාකරුවෙකු ජීවිතයේ එක් වරක් පමණක් පිදුම් ලබන යාවජීව සම්මානයක් වේ.
- අයදුම්කරුවන් මීට පෙර මෙම උත්තමාචාර සම්මානයෙන් පිදුම් නොලබා තිබිය යුතු ය.
- අයදුම්පත් මිසම්භාර පියතුමාගේ හෝ පදවි ජනසන්නිවේදන අධ්‍යක්ෂ පියතුමාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත අයදුම්කරු විසින් හෝ වෙනත් අයෙකු විසින් ඉදිරිපත් කළ හැක.

- අවම වශයෙන් අවුරුදු 15ක නිර්මාණශීලී අත්දැකීම් තිබිය යුතුය.
- අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය හැක.
- විනිශ්චය මණ්ඩලයට නිවැරදි තීරණ ලබා දීම පහසු කිරීම සඳහා අයදුම්පත සමග තමන්ගේ සුදුසුකම් සනාථ කිරීමට අදාල නිර්මාණ, සහතික, ලියවිලි හෝ වෙනත් ඩිජිටල් හෝ මුද්‍රිත මාධ්‍යයෙන් තොරතුරු හැකිතාක් දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතුය. සම්මාන උළෙල පවත්වා මාසයක කාලයකින් අනතුරුව අදාල ලියවිලි නැවතත් ලබා ගත හැක.
- අයදුම්පත් අතරින් සම්මානලාභින් තෝරාගැනීම දෙපාර්තමේන්තුව විසින් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.
- විනිශ්චය මඬුල්ලේ තීරණය අවසාන තීරණය වේ.

## ධර්මප්‍රභාෂ්වර උත්තමාචාර උළෙල සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නන් පහත සඳහන් අංශ යටතේ ඉදිරිපත් විය යුතු ය.

- නිර්මාණශීලි ලේඛන කලාව
- නිර්මාණශීලි සංගීත ක්ෂේත්‍රය
- නිර්මාණශීලි සිනමාකරණය
- නිර්මාණශීලි සිතුවම්කරණය
- නිර්මාණශීලි මූර්ති සහ කැටයම් ශිල්පය
- නිර්මාණශීලි නාට්‍යකරණය
- මාධ්‍ය ක්ෂේත්‍රයේ නිපුණතාවය
- නිර්මාණශීලි ඡායාරූප ශිල්පය
- කලාත්මක ගෘහ නිර්මාණ ශිල්පය
- නිර්මාණශීලි ග්‍රැෆික් නිර්මාණ ශිල්පය හා ශිල්පකලා
- නිර්මාණශීලි වස්ත්‍රාභරණ සහ මෝස්තර නිර්මාණ ශිල්පය
- නිර්මාණශීලි රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදනය
- නිර්මාණශීලී වෙබ් සහ සමාජ මාධ්‍ය නිර්මාණකරණය

අයදුම්කරුගේ  අඟල් **6x4** ප්‍රමාණයට සකසන ලද පැහැදිලි ඡායාරූපයක් එහි පිටුපස නම සඳහන් කර අයදුම්පත සමඟ ලැබිමට සැලැස්විය යුතු ය.

අයදුම්පත් **2026.10.10** දින හෝ ඊට ප්‍රථම දෙපාර්තමේන්තුව වෙත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතු ය.

**අයදුම්පත් භාරදිය යුතු ලිපිනය:**

අධ්‍යක්ෂ
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
3 වන මහල, නො.180,
ටී.බී. ජයා මාවත,
කොළඹ 10.

**වැඩිදුර විස්තර සඳහා 0112665584 (හසිනි මිය)**